# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2020 විෂය නිර්දේශය

**නියාමක ප්‍රශ්න පත්‍රය**

# අදියර I

# 104 - ව්‍යාපාරික පරිසරය [BEN]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි.

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**
104 - **ව්‍යාපාරික පරිසරය** (BEN)
**නියාමක ප්‍රශ්න පත්‍රය**

**අයදුම්කරුවන්ට උපදෙස් (කරුණාකර අවධානයෙන් කියවන්න) :**

**දෙනු ලබන කාලයඃ**

- ලිවීම සඳහා පැය 03 යි.

**ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහයඃ-**

- A කොටස, B කොටස සහ C කොටස ලෙස කොටස් 3 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විතය.
- සියළුම ප්‍රශ්නවලට උත්තර ලිවිය යුතුය

**ලකුණුඃ**

- එක් එක් කොටස සඳහා ලකුණු :

| කොටස | ලකුණු |
|---|---|
| A | 40 |
| B | 40 |
| C | 20 |
| **එකතුව** | **100** |

- එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු පෙන්වා ඇත. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා සමත්වීමේ ලකුණු 50% කි.

**උත්තරඃ**

- සියළුම උත්තර,සපයනු ලබන උත්තර පොත්වල ලිවිය යුතුය. ප්‍රශ්නපත්‍රවල ලියනු ලබන උත්තර ලකුණු දීම් සඳහා ඇගයීමට ලක් නොකරනු ඇත.
- එක් එක් ප්‍රශ්නය සඳහා ඔබේ උත්තරය අළුත් පිටුවකින් ආරම්භ කරන්න.
- සියලුම පෙර වැඩ පැහැදිලිව පෙන්නුම් කළ යුතුය.
- තීරුවල උත්තර නොලිවිය යුතුය.

**උත්තර පොත්ඃ**

- එක් එක් උත්තර පොතේ මුල් පිටුවේ උපදෙස් පෙන්වා ඇත.

**ගණකයන්ත්‍රඃ**

- සංකේත වීජගණිතමය හා අවකලනය සඳහා පහසුකම් සලසා ඇති ඒවා හැර ඕනෑම ගණක යන්ත්‍රයක් අයදුම්කරුවන්ට භාවිත කිරීමට අවකාශය ඇත. වැඩසටහන් කළ හැකි ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

**ඇමුණුම්ඃ-**

- කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව. එක් එක් ප්‍රශ්නය (වාස්තවික පරීක්ෂා ප්‍රශ්න හැර) කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ දී ඇති නිර්වචනය මත පදනම්ව අයදුම්කරුවන් විසින් උත්තර සැපයිය යුතුය.

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**
**අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.**

**A කොටස**

(එකකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 40)

***01 ප්‍රශ්නය***

**අංක 1.1 සිට 1.10 දක්වා වූ ප්‍රශ්න සඳහා වඩාත්ම යෝග්‍ය උත්තරය තෝරන්න. ඔබ තෝරාගත් අංකය,ප්‍රශ්නයට දී ඇති අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.**

1.1 පහත සඳහන් ඒවා අතුරෙන් වුවමනා සඳහා උදාහරණයක් වන්නේ කුමක්ද ?

(1) ආහාර. (2) රැකියා සුරක්ෂිතාවය. (3) නිවාස. (4) ආරක්ෂාව.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන් කේවලස්වාමී ව්‍යාපාරයක **අවාසියක්** වන්නේ කුමක්ද ?

(1) ඉහළ මට්ටමේ නෛතික අවශ්‍යතා. (2) අසීමිත වගකීම.
(3) තීරණ ගැනීමේ ප්‍රමාදය. (4) ඉහළ මට්ටමේ ආරම්භක ප්‍රාග්ධනය.

1.3 පහත සඳහන් ඒවා අතුරෙන් උපකාරක සේවාවක් සඳහා උදාහරණයක් **නොවන්නේ** කුමක් ද?

(1) අධ්‍යාපනය (2) සන්නිවේදනය
(3) රක්ෂණය (4) ගබඩා කළමනාකරණය

1.4 පහත සඳහන් ඒවා අතුරෙන් සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංගයක් **නොවන්නේ** කුමක්ද?

(1) පණිවුඩය (2) යවන්නා (3) ශබ්දය (4) අරමුණ

1.5 කෙටිකාලීන ණය ඉල්ලුම් හා කෙටිකාලීන සැපයුම් වාණිජ බැංකු අතර සිදුකෙරෙන වෙළඳපල වන්නේ:

(1) භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොලයි.

(2) අන්තර බැංකු එක්ෂණ වෙළඳ පොලයි.

(3) කොටස් වෙළඳ පොලයි.

(4) සංස්ථාපිත බැඳුම්කර වෙළඳපොලයි.

1.6 පහත සඳහන් ඒවා අතුරෙන් ජීවිත රක්ෂණ ගිවිසුමක ලක්ෂණයක් **නොවන්නේ** කුමක්ද?

(1) උපරිම විශ්වාසය. (2) වලංගු ගිවිසුමක්.

(3) හානිපූර්ණය. (4) රක්ෂණ හිමිකම.

1.7 චෙක්පතක රේඛනය අවලංගු කළ හැකි තැනැත්තා වන්නේ:

(1) මාරුකරනු ලබන්නායි. (2) වාණිජ බැංකුවයි.

(3) ආදායකයයි. (4) අණකරුයි.

1.8 පහත සඳහන් ඒවා අතුරෙන් වරලත් එකගත්වයක ලක්ෂණයක් **නොවන්නේ** කුමක්ද?

(1) වරලත්හිමියා සාමානයෙන් වරලත්ලාභියාට ඔහුගේ සන්නාම නාමය භාවිතයට ඉඩදේ.

(2) ලාභය සාමාන්‍යයෙන් වරලත්හිමියා සහ වරලත්ලාභියා විසින් බෙදාගනු ලබයි.

(3) වරලත්හිමියා සාමාන්‍යයෙන් වරලත්ලාභියාට පුහුණු වීමේ සේවා සපයයි

(4) වරලත්හිමියා සාමාන්‍යයෙන් වරලත්ලාභීන්ට තාක්ෂණික සහයෝගය ලබාදේ.

1.9 පහත සඳහන් ප්‍රකාශනයන් අතුරින් සීමාසහිත පෞද්ගලික සමාගමක් සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක්ද?

(1) කොටස් හිමියන්ගේ උපරිම ගණන 20 කි.

(2) මහජනතාව කොටස් නිකුත් කළ හැකිය.

(3) අධ්‍යක්ෂවරුන්ගේ අවම ගණන 1කි.

(4) වාර්ෂික වාර්තාව ප්‍රසිද්ධ කිරීම අනිවාර්ය වේ.

1.10 පහත සඳහන් දෑ අතුරින් තේවල ස්වාමී ව්‍යාපාරයක් සමඟ සසඳද්දී හවුල් ව්‍යාපාරයක වාසියක් වන්නේ කුමක්ද?

(1) වගකීම සීමිත වීම.

(2) ප්‍රාග්ධනය වැඩි ප්‍රමාණයක් සපයා ගැනීමේ හැකියාව.

(3) තීරණ එක් පුද්ගලයෙක් විසින් පමණක් ගැනීම.

(4) නෛතික පුද්ගලභාවයක් නොමැතිවීම.

**පහත දැක්වෙන එක් එක් ප්‍රකාශන සත්‍යද අසත්‍යද යන්න සඳහන් කරන්න. සත්‍ය /අසත්‍ය යන උත්තර ප්‍රශ්නයට අදාල අංක සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න**

1.11 භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ, මුදල් වෙළඳපොලෙහිම කොටසකි.

1.12 සේවකයන්ගේ කේවල් කිරීමේ බලය "පෝටර්ගේ" පංච බලවේග ආකෘතියේ සංරචකයකි.

1.13 විද්‍යුත් වානිජ්‍යය ජනප්‍රියතාවයට හේතුවක් වන්නේ ගනුදෙනුකරුවන්ගේ කාලය සහ ශ්‍රමශක්තිය ඉතිරිකිරීමයි.

1.14 කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයන්ට විශිෂ්ටතා සම්මාන ප්‍රදාන පිරිනැමීම, රජය විසින් ලබාදෙන මූල්‍ය නොවන දිරි දීමනාවකි.

1.15 මහජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම,සමාජයීය සහ සංස්කෘතික තිරසාරත්වය සඳහා ව්‍යාපාරයේ දායකත්වයේ සාධකයක් වේ.

**1.16 සිට 1.20 දක්වා ප්‍රශ්න වලට උත්තර ඔබේ උත්තර පොතේ ප්‍රශ්නවලට දී ඇති අංකය සමඟ ලියන්න.**

1.16 කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයන්ගේ ලක්ෂණ හතර(04)ක් සඳහන් කරන්න.

1.17 ව්‍යවසායකයෙකු සහ ව්‍යාපාරිකයකු අතර ඇති වෙනස්කම් දෙක (2)ක් සඳහන් කරන්න

1.18 කාර්ය පාරිසරික බලවේග හතර (04)ක් ලැයිස්තුගත කරන්න.

1.19 චෙක්පතක් අගරු විය හැකි අවස්ථා හතර(04)ක් සඳහන් කරන්න.

1.20 හවුල්කරුවෙකුගේ යුතුකම් හතර(04)ක් සඳහන් කරන්න.

**(එකකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 40)**

## *A කොටස අවසානය*

**අනිවාර්ය ප්‍රශ්න හතර(04) කි.**

**B කොටස**

(මුළු ලකුණු 40)

### *02 ප්‍රශ්නය*

වෙළඳාම සහ උපකාරක සේවා, වාණිජ්‍යයේ සංරචක දෙක වේ. සරලව වෙළඳාම යන්නෙන් අදහස් කරන්නේ භාණ්ඩයක හෝ සේවාවක අයිතිය එක් තැනැත්තෙකුගෙන් තවත් තැනැත්තෙකුට මිලකට හුවමාරු වන මිලදී ගැනීම හෝ විකිණීමයි. වෙළඳාම නූතන මානව අවශ්‍යතා සහ වුවමනා ඉටු කිරීමේ අත්‍යාවශ්‍ය කොටසකි.

**ඔබ විසින් කළයුතු දෑ:**

(a) බෙදාහැරීමේ මාධ්‍ය හතර (04 ) **හඳුනා දක්වන්න.** **(ලකුණු 02)**

(b) රටකට විදේශ වෙළඳාම වැදගත්වන්නේ ඇයිදැයි දැක්වීමට හේතු හතරක් (04) **පැහැදිලි කරන්න.** **(ලකුණු 06)**

(c) තොග වෙළඳාමේ ලක්ෂණ හතරක් (04) **සඳහන් කරන්න.** **(ලකුණු 02)**

**(මුළු ලකුණු 10)**

### *03 ප්‍රශ්නය*

සීමාසහිත **සස්ටේනින් එනර්ජි(පුද්ගලික)සමාගම** සූර්යබල පැනල නිෂ්පාදන සමාගමකි. එය හොඳම දෑ තොරාගැනීමට විකල්ප ඇගයීමේ තීරණ ගන්නා විට පෘතුවිය හා මානව වර්ගයාට ඇති කෙරෙන බලපෑම් කෙරෙහි සලකනු ලබයි. තවද එහි සමාජ වගකීම් සහ ස්වාභාවික සම්පත් සුරැකීම සහ සමාජ සාධාරණය ඉටු කිරීමට එහි දායකත්වය පිළිබඳව සමාගමේ කළමනාකරණය මහත් ආඩම්බරයට පත්ව සිටී.

**ඔබ විසින් කළයුතු දෑ:**

(a) **සී/ස සස්ටේනින් එනර්ජි (පුද්ලික) සමාගම** වැනි ව්‍යාපාරයක ප්‍රධාන අරමුණු තුනක් (03) **සඳහන් කරන්න.** **(ලකුණු 03)**

(b) **සී/ස සස්ටේනින් එනර්ජි (පුද්ගලික) සමාගම** සඳහා සාංගමික සමාජයිය වගකීමේ වාසි තුනක් (03) **ලැයිස්තුගත කරන්න.** **(ලකුණු 03)**

(c) **සී/ස සස්ටේනින් එනර්ජි (පුද්ගලික) සමාගම** සඳහා ව්‍යාපාර ආචාරධර්මවල වැදගත්කම **පැහැදිලි කරන්න.** **(ලකුණු 04)**

**(මුළු ලකුණු 10)**

## *04 ප්‍රශ්නය*

ව්‍යාපාරික කටයුතු ඉහළ නැංවීමට පමණක් නොව සමාන්‍ය ජන ජීවිතය පහසුවෙන් කළමනාකරණය කිරීමටද වාණිජ බැංකු ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරයි. රටතුළ සිදුවන ගණුදෙනුවක දී නැතහොත් රටවල් අතර සිදුකෙරෙන ගනුදෙනුවකදී ඒවා කාර්යක්ෂම ලෙස ඉටුකිරීමෙහි ලා වාණිජ බැංකුවල දායකත්වය ප්‍රසංසනීයය. කෙසේ වෙතත් වාණිජ බැංකුවල කාර්යයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රමාණවත් පරිදි නියාමනය කරනු ලබයි.

**ඔබවිසින් කළයුතු දෑ:**

(a) ව්‍යාපාරයකට වාණිජ බැංකුවකින් ඉටුවන සේවාවන් හතරක් (04) **සඳහන් කරන්න.** **(ලකුණු** 02)

(b) ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යන් තුනක්(03) **සඳහන් කරන්න.** **(ලකුණු** 03)

(c) වර්තමානයේ භාවිතාකරන විද්‍යුත් මුදල් වර්ග තුනක් (03) **පැහැදිලි කරන්න.** **(ලකුණු** 05)

***(මුළු ලකුණු** 10)*

## *05 ප්‍රශ්නය*

රක්‍ෂණය ව්‍යාපාරයට ඉතා වැදගත් උපකාරක සේවවාකි. සිදුවිය හැකි මූල්‍ය පාඩුවීමේ අවදානමට එරෙහිව මූලික වැට බැඳීමක් ලෙස කරනු ලබන රක්ෂණය එක් ආකාරයක අවදානම් කළමනාකරණයකි.

**ඔබ විසින් කළයුතු දෑ**

(a) ව්‍යාපාරික සංවිධානයකට රක්ෂණය වැදගත්වන්නේ ඇයිදැයි යන්නට හේතු හතරක් (04) **පැහැදිලි කරන්න.** **(ලකුණු** 06)

(b) ශ්‍රී ලංකාවේ භාවිතා කෙරෙන රක්‍ෂණ ඔප්පු වර්ග හතරක්(04) **ලැයිස්තුගත කරන්න** **(ලකුණු** 02)

(c) රක්‍ෂණ මූලධර්ම හතරක් (04) **ලැයිස්තුගත කරන්න.** **(ලකුණු** 02)

**(මුළු ලකුණු** 10)

## ***B කොටසේ අවසානය***

**අනිවාර්ය ප්‍රශ්නයකි.**

**C කොටස**

**(මුළු ලකුණු 20)**

## *06 ප්‍රශ්නය*

ජ්ජ්ටී වෘත්තීය සුදුසුකම සපිරීමෙන් සහ විශ්ව විද්‍යාල උපාධිය ලබා ගැනීමෙන් පසු **සමන්** ඔහුගේම වෘත්තිය අධ්‍යාපනය හැදෑරීමේ මධ්‍යස්ථානය පස් වසරකට පෙර, ශිෂ්‍යයන් පස් දෙනෙකුගෙන් ආරම්භ කළේය. විභාගවලදී මුළු දිවයිනෙන්ම ජ්ජ්ටී ත්‍යාග දෙකක් දිනූ දක්ෂයෙකු නිසාද, ඉගැන්වීමේ පළපුරුද්ද නිසාද ඔහුගේ ව්‍යාපාරය මේ වන විට ශිෂ්‍යයන් 500 දෙනෙකු දක්වා වර්ධනය වී ඇති අතර **සමන්** අවංකවම ඒ ගැන සතුටට පත්වේ. සමාජයට සහ ශ්‍රී ලාංකීය ආර්ථිකයට ඔහුගේ දායකත්වය නිසා ඉකුත් සතියේ හොඳම කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකගේ ත්‍යාගය ඔහුට පිරිනමා තිබේ.

කෙසේ වෙතත් තනිපුද්ගල ව්‍යාපාරිකයෙකු ලෙස තම ව්‍යාපාරය ව්‍යාප්ත කර ගැනීම සඳහා සීමාකරණයන් කිහිපයක් ඔහුට එරෙහි වෙමින් ඇත. වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමේ වැදගත්කම පිලිබඳ දැනුවත්භාවය දෙමාපියන් සහ ශිෂ්‍යයන් තුළ වර්ධනය වී ඇතත් ප්‍රාග්ධනය අඩුකම සහ තරගකාරීත්වය ඉහළනැංවීම නිසාත් ඔහුගේ ව්‍යාපාරය තවදුරටත් ව්‍යාප්ත කරගැනීමට ඔහුට නොහැකි වී තිබේ.

ශ්‍රී ලංකාව තුළ මේ වකවානුවේ කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරයන් මුහුණපාන බොහෝ අභියෝගයන්ට **සමන්**ටද මුහුණ දීමට සිදුව තිබේ. එසේ වුවත් අභියෝගවලට මුහුණ දෙන ව්‍යවසායකයෙකු ලෙස **සමන්**ට එය අළුත් දෙයක් නොවේ. පසුගිය වර්ෂ 05 තුළදී තර්ජන හොඳ අවස්ථාවක් බවට පරිවර්තනය කිරීමෙන් ඔහු සාර්ථක වී ඇත.

**ඔබ විසින් කළයුතු දෑ:**

(a) කේවලස්වාමී ව්‍යාපාරයකට වාසි දෙකක් (02) හා අවාසි දෙකක් (02) **සඳහන් කරන්න.** **(ලකුණු 04)**

(b) ශ.දු.අ.ත. (SWOT) විශ්ලේෂණ භාවිත කරමින් **සමන්ගේ** ව්‍යාපාරික පරිසරය **තක්සේරු කරන්න.** **(ලකුණු 06)**

(c) ශ්‍රී ලාංකීය කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරිකයින්(SME) මුහුණපාන අභියෝග හතරක්(04)ක් **සඳහන් කරන්න.** **(ලකුණු 04)**

(d) ව්‍යවසායකයන්ගේ ලක්ෂණ හතරක් (04) **ලැයිස්තුගත කරන්න.** **(ලකුණු 02)**

(e) රටකට ව්‍යවසායකත්වයේ දායකත්වයන් හතරක් (04) **හඳුනා දක්වන්න** **(ලකුණු 04)**

**(මුළු ලකුණු 20)**

## *C කොටසේ අවසානය*

# කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| | | | |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න |
| | | වෙනස් කොට දක්වන්න | යමක් තවෙකකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම |
| | | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම |
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිතකර ගැළපීම | භාවිත කරන්න | ප්‍රායෝගිකව භාවිතයේ යෙදෙන්න |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම |
| | | පිළියෙළ කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම |
| | | විසඳන්න | ගණනය කිරීම හා හෝ පැහැදිලි කිරීම හරහා විසඳුම් සෙවීම |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මකබව තීරණය කරන්න |
| | | ප්‍රස්ථාර දක්වන්න | ප්‍රස්ථාර මගින් නියෝජනය කරන්න |
| | | සසඳන්න | තවත් එකක් සමග අනුගත/අනුරූප කරන්න |
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න |
| | | අර්ථකථනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න |
| | | හඳුනා ගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම |
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම |
| | | අඳින්න | හැඩයක් හෝ රූප සටහනක් ගෙනහැර දැක්වීම |
| **නිපුණතා මට්ටම** | **විස්තරය** | **ක්‍රියා ලැයිස්තුව** | **ක්‍රියා නිර්වචනය** |

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2020 විෂය නිර්දේශය

## ආදර්ශ විසඳුම්

## අදියර I

# 104 - ව්‍යාපාරික පරිසරය [BEN]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි.

**වාස්ථවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**
අනිවාර්ය ප්‍රශ්න 20 කි.

(මුළු ලකුණු 40)

**A කොටස**

**01 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **1.1** | - 2 | **1.6** | - 3 | **1.11** | - සත්‍යයි |
| **1.2** | - 2 | **1.7** | - 4 | **1.12** | - අසත්‍ය |
| **1.3** | - 1 | **1.8** | - 2 | **1.13** | - සත්‍යයි |
| **1.4** | - 3 | **1.9** | - 3 | **1.14** | - සත්‍යයි |
| **1.5** | - 2 | **1.10** | - 2 | **1.15** | - සත්‍යයි |

**(එකකට ලකුණු 2 බැගින් ලකුණු 30 යි.)**

**1.16** - ආයෝජනය අඩුවේ.
- පවුලේ සාමාජිකයින් සේවයේ යොදවනු ලැබේ.
- වෙළඳපළක් තිබේ.
- ව්‍යාපාරය දේශීය වෙළඳපළ ඉලක්ක කෙරේ.
- සේවක මණ්ඩලය අඩුවේ.

**(ලකුණු ½ බැගින් - ලකුණු 02)**

**1.17**

| **ව්‍යවසායකයා** | | **ව්‍යාපාරිකයා** |
|---|---|---|
| ඔහුගේ අදහස් අනුව හෝ නව සංකල්පයන් අනුව ආරම්භ කෙරේ. | - | පවත්නා අදහස් හෝ සංකල්ප මත ආරම්භ කෙරේ. |
| ඔහු නවෝත්පාදකයෙකි. | - | ඔහු සාම්ප්‍රදායික දෑ පිළිගන්නෙකි. |
| ඔහු අවදානම්වලට මුහුණ දෙයි. | - | ඔහු අවදානම් වලට මුහුණ දීමට අකමැතිය. |

**(කරුණු 2ට ලකුණු 02)**

**1.18** - පාරිභෝගිකයන්
- සැපයුම්කරුවන්
- තරඟකරුවන්
- පීඩන කණ්ඩායම්

**(ලකුණු ½ බැගින් - ලකුණු 02)**

**1.19** - ගිණුමේ ප්‍රමාණවත් අරමුදල් නොතිබීම.

- අණකරු බුන්වත් වීම.
- අණකරු ගෙවීම අත්හිටුවීම. (නැවැත්වීම)
- ගිණුම වසාදමා තිබීම.
- චෙක්පත ලිවීමේදී ඇතිවූ වැරැද්දක් නිසා. **(ලකුණු ½ බැගින් ලකුණු 02)**

**1.20** - සද්භාවයෙන් කටයුතු කිරීම.

- යම්කිසි වංචාසහගත ක්‍රියාවකට වගකිව යුතු වීම හා එයින් පැන නගින අලාභය විඳදරා ගැනීම.
- කාර්යක්‍ෂමව ව්‍යාපාරික කටයුතුවල නියැලීම.
- තමාගේ පුද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා වැඩ නොකිරීම.
- තරගකාරී ව්‍යාපාරික කටයුතුවලින් ලාභ උපයා නොගැනීම. **(ලකුණු ½ බැගින් - ලකුණු 02)**

**(ලකුණු 2 බැගින් - මුලු ලකුණු 40)**

**අනිවාර්ය ප්‍රශ්න හතර(04) කි.**

**B කොටස**

(මුළු ලකුණු 40)

02 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු

**ඒකක 04-ව්‍යාපාර සංවිධානවල වෙළදාම**

ඉගෙනුම් ප්‍රතිඵල - වෙළදාම හා බෙදා හැරීමේ මාධ්‍ය හඳුනා ගැනීම.

- සිල්ලර,තොග,අපනයන සහ ආනයන වෙළදාමේ නව ප්‍රවණතා හඳුනාගැනීම.

**(a)**

**0 මට්ටම**

නිෂ්පාදක → ගණුදෙනුකරු

**1- මට්ටම**

නිෂ්පාදක → සිල්ලර වෙළෙන්දා → ගණුදෙනුකරු

**2- මට්ටම**

නිෂ්පාදක → තොග වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා → ගණුදෙනුකරු

**3- මට්ටම**

නිෂ්පාදක → තොග වෙළෙන්දා → නියෝජිතයා/තැරැව්කරු →
සිල්ලර වෙළෙන්දා → ගණුදෙනුකරු

**( ලකුණු 02)**

**(b)**

(1) **ශ්‍රම විභජනය සහ විශේෂීකරණය -** විදේශ වෙළඳාම ලෝක මට්ටමෙන් ශ්‍රම විභජනයට හා විශේෂීකරණයන්ට මඟ පාදයි. ඇතැම් රටවල් බහුල ස්වාභාවික සම්පත් සහිත බැවින් අමුද්‍රව්‍ය අපනයනය කර පුහුණු ශ්‍රමයෙන් ඉහළ මට්ටමේ පවත්නා රටවලින් නිමි භාණ්ඩ ආනයනය කළ යුතුය. මෙයින්, ශ්‍රම විභජනයට හා විශ්ලේෂීකරණයට මග පාදමින් විදේශ වෙළඳාම සියළුම රටවලට ප්‍රතිලාභ ගෙනදේ.

(2) **ප්‍රශස්ත ලෙස සම්පත් බෙදා හැරීම සහ උපයෝජනය -** විශේෂීකරණය නිසා ඵලදායී නොවන දෑ ඉවත්කළ හැකි අතර සම්පත් අපතේ යෑම අවම කිරීම හෝ වැළැක්වීම සිදුකළ හැකිය. වෙනත් වචනවලින් කිවහොත් ඉහළම ප්‍රතිලාභ දෙනු ලබන භාණ්ඩ පමණක් නිෂ්පාදනය කිරීමට සම්පත් උපයෝගී කරවනු ලැබේ. මෙපරිද්දෙන් විදේශ වෙළඳාම නිසා ජත්‍යන්තර මට්ටමෙන් තර්කාන්විතව සාධාරණ ලෙස සම්පත් වෙන්කිරිම සහ උපයෝගීතාවය සිදුවේ.

(3) **මිල සමානතාව -** විදේශ වෙළඳාම මගින් මිල ස්ථාවරත්වය ඇතිකළ හැකිය. එය ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයෙන් ස්ථාවරව පවත්වා ගැනීමට උපකාර වන අතර අනෙක් අතට මිල ස්ථාවරත්වයද තහවුරු කෙරේ.

(4) **බහුවිධ තෝරා ගැනීම් තිබීම -** පාරිභෝගිකයන්ට වඩා හොඳ තොරා ගැනීම් සපයා දීමට විදේශ වෙළඳාම් උපකාර කරයි. පාරිභෝගිකයන්ට තෝරා ගැනීම සඳහා පුළුල් විවිධත්වයෙන් යුත් විකල්ප ලබා දෙමින් ලෝකය පුරා ඇති විවිධාකාර අළුත් දේවල් මිලදී ගැනීමට උපකාරී වේ.

(5) **භාණ්ඩවල ගුණාත්වය සහ ප්‍රමිතිය සහතික කිරීම -** විදේශිය වෙළඳාම අතිශයින් තරගකාරී වේ. භාණ්ඩ සඳහා ඉල්ලුම පවත්වා ගැනීම සහ වැඩිකර ගැනීම සඳහා අපනයනය කරන රටවල් භාණ්ඩවල ගුණත්වය පවත්වා ගත යුතු වේ. මෙයින්, නිශ්පාදනය කරන භාණ්ඩවල ගුණාත්වය සහ ප්‍රමිතිය පවත්වා ගැනීම විදේශිය වෙළඳාම සහතික කෙරේ.

(6) **මිනිසුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවයි. -** ආනයන වල මිනිසුන්ගේ ජීවන තත්ත්වය පහසුකරවිම කළ හැකිය. එනම් අළුත් සහ වඩා හොඳ වර්ගවල භාණ්ඩ සහ සේවා තෝරා ගැනීමේ හැකියාව මිනිසුන්ට ලැබෙන නිසාය. වඩා හොඳ අළුත් භාණ්ඩ පරිභෝජනයෙන් තම ජීවන තත්ත්වය මිනිසුන්ට වැඩිදියුණු කර ගත හැක.

(7) **රැකියා අවස්ථා ජනනය කිරීම -** ශ්‍රමයේ සහ සම්පත්වල එහා මෙහා කිරීම වැඩි කිරීම මගින් විදේශ වෙළඳාම රැකියා අවස්ථා ජනනය කිරීමට උපකාරී වේ. ආර්ථිකයේ ආනයන අංශයේ ඍජු රැකියා ජනනය සහ වෙනත් අංශ එනම් වක්‍ර රැකියා ජනනනයද එයින් සිදු කෙරේ.

(8) **ආර්ථික සංවර්ධනයට පහසුකම් සලසයි -** ආනයන අපනයන,ජාතියක ආර්ථික සංවර්ධනයට පහසුකම් සලසයි. මෙය සිදුවන්නේ ප්‍රාග්ධන භාණ්ඩ සහ තාක්ෂණය ආනයනය තුළිනි. ආර්ථිකයේ සියළුම අංශවල එනම්,කෘෂිකර්මය ,කර්මාන්ත සහ සේවා අංශ වල වර්ධනය ජනනය කිරීම සිදුකළ හැකි නිසාය.

(9) **ස්වාභාවික විපත්වලදී ආධාර -** භූමිකම්පා,ගංවතුර,දුර්භික්ෂ වැනි ස්වාභාවික ව්‍යසනයන්ට භාජනය වූ රටවල් වලට අත්‍යාවශ්‍ය ආහාර හිඟයන්ට මුහුණ පෑමට සිදුවේ. ආපදාවලට ලක්වූ අයට උපකාර වීම සඳහා ආහාර වර්ග රට තුළට ආනයන කර ගැනීමට විදේශ වෙළදාම හැකියාව ලබා දේ.

(10) **ගෙවීම් ශේෂ තත්ත්වය පවත්වා ගැනීම-**සෑම රටකම එහි ගෙවුම් ශේෂ තත්ත්වය පවත්වා ගත යුතුව තිබේ. විදේශ විනිමය විවෘත ගලායාම සිදුවන ආනයන සෑම රටකම සිදු කිරීමට යෙදෙන නිසා විදේශ විනිමය ඇතුළට ගලා එන අපනයනය ගැනද එයට කටයතු කිරීමට සිදුවේ.

(11) **කීර්තිය ගෙන එන අතර කීර්තිනාමය ඉපයීමට උපකාරක වේ -** අපනයනය සිදුකිරීමට සම්බන්ධවන රටක් ජාත්‍යන්තර වෙළදපොලේ කීර්තිනාමය උපයාගනී. උදාහරණයක් වශයෙන් ගුණත්වයෙන් යුතු ඉලෙක්ට්‍රොනික භාණ්ඩ අපනයනය නිසා ජපානය විදේශ වෙළදපොලවල්වල මහත් කීර්තිනාමයක් උපයාගෙන ඇත.

(12) **ලෝක සාමය ප්‍රවර්ධනය කිරීම -** විදේශ වෙළදාම නිසා රටවල් එකිනෙකාට කිට්ටුවෙන් සම්බන්ධ වේ. දියුණු රටවලින් දියුණුවන රටවල් වලට තාක්ෂණය සහ වෙනත් ආධාර මාරු කිරීම සඳහා එමගින් පහසුකම් සැලසේ. වෙළඳ ගිවිසුම් තුළින් පැන නගින ආර්ථික සම්බන්ධතා නිසා එය විවිධ රටවල් අතර සමීපතා ගොඩ නගයි. මේ තුළින් විදේශ වෙළදාම යුද්ධ සහ ගැටුම් මගහරවන මිත්‍රශීලී පරිසරයක් බිහිකරයි. එබඳු රටවල් ඔවුනොවුන් අතර මිත්‍රශීලී සම්බන්ධතා පවත්වාගැනීමට උත්සාහකරන බැවින් එය ලෝක සාමය ප්‍රවර්ධනය කිරීමට අනුගත වීමකි.

**(ඕනෑම වාසි 4 ක් විස්තර කිරීමටකට ලකුණු 06)**

**(c)**

1. නැවත විකිණීමේ අරමුණ ඇතිව භාණ්ඩ මිලදී ගැනීම.
2. ගොඩවල්/සමූහ වශයෙන් භාණ්ඩ විකිණීම.
3. වෙළඳ වට්ටම් සඳහා ඉඩ සැලසීම
4. විශාල ප්‍රමාණයන්ගෙන් භාණ්ඩ ගබඩා කිරීම.
5. විකුණුම් ප්‍රවර්ධන ක්‍රියාකාරකම් වල නිරත වීම
6. වෙළඳ පර්යේෂණ සිදුකිරීම
7. තොග වශයෙන් භාණ්ඩ බෙදා හැරීමේදී ප්‍රවාහන සේවා සැපයීම.

**(ඕනෑම උත්තර 04 කට ලකුණු 2)**

**03 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

**ඒකක 1 -** **ව්‍යාපාරයක සංකල්පය සහ විවිධ සංවිධාන වර්ග**

**ඒකක 5 -** **ව්‍යාපාරවලට රජයේ බලපෑම්, ව්‍යාපාර ආචාරධර්මවල වැදගත්කම සහ ව්‍යාපාරයක සාංගමික සමාජ වගකීම (CSR)**

ඉගෙනුම් ප්‍රතිඵල - ව්‍යාපාරයක සංකල්ප පැහැදිලි කිරීම.

- ව්‍යාපාරික ආචාරධර්මවල වැදගත්කම හඳුනා පැහැදිලි කිරීම.
- ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කිරීමට සාංගමික වගකීම්වල **(CSR)** අවශ්‍යතාවය හඳුනාගැනීම.

**(a)**

(1) අයිතිකරුගේ ධනය උපරිම කිරීම.

(2) දිගු කාලීන වර්ධනය.

(3) සේවක සුබසාධන වැඩිදියුණු කිරීම.

(4) ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීම හෝ පරිසරය කෙරෙහි සෘණාත්මක බලපෑම අඩුකිරීම.

(5) දේශීය ජන සමාජයේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම.

(6) ගනුදෙනුකරුගේ තෘප්තිමත්භාවය උපරිමකිරීම.

**(ඕනෑම කරුණු 03 කට ලකුණු 3)**

**(b)**

(1) ව්‍යාපාරයේ කීර්තිය ඉහළනැංවීම.

(2) සේවකයන්ගේ සදාචාරය වැඩිදියුණු කිරීම.

(3) හරිත පාරිභෝගිකයන් ආකර්ෂණය කිරීමේ හැකියාව.

(4) බදු ප්‍රතිලාභ.

(5) දේශීය ජන සමාජයෙන් වැඩි සහයෝගය ලබා ගැනීම.

**(ඕනෑම කරුණු 03 කට ලකුණු 3)**

**(c)**

(1) **මූලික මානව අවශ්‍යතාවයන්ට අනුකූල වීම:**

සෑම මනුෂ්‍යයෙකුගේම මූලික අවශ්‍යතාවය වන්නේ ඔවුන් ගරුකළ හැකි සහ ආඩම්බර විය හැකි සදාචාරාත්මක දෙයක් ලෙස ඔවුන් වටහාගනු ලබන සංවිධානයේ කොටසක් ලෙස ඔවුන් සිටීමේ උවමනාවයි. අවංක හා සමාජ වගකීම් දරණ සංවිධානයක් ලෙස සමාජය විසින් පිළිගන්නා සංවිධානයක් ආශ්‍රිතව සිටීමට සෑම දෙනෙකුම කැමතිය. සේවකයන්ගේ මෙම මූලික අවශ්‍යතාවය සපුරාලීමට මෙන්ම සදාචාරාත්මක සංවිධානයකට මග පෑදීම සම්බන්ධව ඔවුන්ගේම අවශ්‍යතාවය ඉටු කිරීමට ද මානව සම්පත් කළමනාකරුවන්ට සිදුවේ. සේවකයන්ගේ මෙන්ම කළමනාකරුවන්ගේ මූලික අවශ්‍යතා සංවිධානයක් සදාචාරාත්මක නැඹුරු වීමට යොමු කෙරේ.

(2) **ජනතාව තුළ විශ්වාසවන්තභාවය:**

සංවිධානයක සදාචාරාත්මක වටිනාකම් ජනතා දෘෂ්ටිකෝණයෙන් විශ්වාසවන්තභාවය බිහි කෙරේ. සමාගමක් අවංක නම් හා මුදලේ අගයට සරිලන වටිනාකමක් ලබාදෙයි යැයි ඔවුන් විශ්වාස කරන්නේ නම් මහජනයා එම සමාගමේ නිශ්පාදිත මිලදී ගැනීමට කැමති වනු ඇත. එබඳු සමාගම් වල මහජන නිකුතු සාර්ථක වීම නියතය. ඔවුන්ගේ නිශ්පාදිත ආරක්ෂිත බවද කවරාකාරයෙන් හෝ කෘමිනාශක වලින් තොර බවද මහජනයා වෙත ඒත්තු ගැන්වීමට මේ දිනවල වෙළඳ දැන්වීම් සඳහා විශාල මුදල් ප්‍රමානයක් කෝලා සමාගම් මගින් වියදම් කරනු ලබන්නේ මෙම හේතුව නිසාය.

(3) **සේවකයන්ගේ විශ්වාසවන්තභාවය:**

තමන් සේවය කරන සංවිධානයේ සදාචාරාත්මක වටිනාකම් ගැන සේවකයන් ඒත්තු ගැන්වීම සිදුවූ කළ ඔවුන් සංවිධානය ඉතා උතුම් කොට සලකයි. එය පොදු ඉලක්ක වටිනාකම් සහ භාෂාවන් නිර්මාණය කරයි. සංවිධානයට මහජනයා අභිමුඛයේ විශ්වාසකටයුතු බව ඇති නිසාම මානව සම්පත් කළමනාකරු සේවකයන් සමග විශ්වාස කටයුතු භාවය ඇති කර ගනී.

(4) **වඩා හොඳ තීරණ ගැනීම:**

සදාචාරසම්පන්න වීම කෙරෙහි දක්වන ගරුත්වය විසින් විවිධ ආර්ථික සමාජ හා සදාචාර පැතිකඩයන් සැලකිල්ලට ගැනීම තීරණ ගැනීමේදී සිදුවනු ඇත. ගනු ලබන තීරණ මහජනතාවටත් සේවකයන්ගේ සහ සමාගමේම දිගුකාලීන යහපත සඳහා ප්‍රයෝජනවත් වේ නම් තීරණ ගැනීමේ ක්‍රියාවලිය වඩා යහපත් වේ.

(5) **ලාභදායකත්වය:**

ලාභ කිසිවක් උපයා නොගැනීම සදාචාරසම්පන්න වීම යනුවෙන් අදහස් නොකෙරේ. සෑම සංවිධානයකටම ඒ සඳහාද වගකීමක් එනම් ලාභ ඉපයීමක් තිබේ. සදාචාරසම්පන්න සමාගම් කෙටිකාලයේදී මූල්‍යම පාඩු ලැබුවද දිගුකාලීනව වඩා ලාභදායී සහ සාර්ථක වීම නියතවනු ඇත.

(6) **සමාජය ආරක්ෂා කිරීම:**

රටේ නෛතික පද්ධතියකටද වඩා යහපත් ආකාරයට අචාරධර්ම වලට සමාජය ආරක්ෂා කළ හැකිය. නීතිය අසාර්ථකවන තැන්හි ආචාරධර්ම සැමවිට සාර්ථක වේ. සමාජයට හානිකර සියළුම ක්‍රියාකාරකම් රජයට නියාමනය කළ නොහැකිය. ආචාරධර්ම වලින් පිරිපුන් මානවසම්පත් කළමනාකරුවෙකුට කලහකාරී සේවක පිරිසක් වෙත පොලීසියට වඩා සඵලදායකව ප්‍රවිශ්ඨ විය හැක.

**(ඕනෑම කරුණු 04 කට ලකුණු 4)**

**(මුළු ලකුණු 10)**

**04 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | |
|---|---|
| **ඒකක 3 - ව්‍යාපාරවලට උපකාරක සේවා** | |
| ඉගෙනුම් ප්‍රතිඵල | - උපකාරක සේවාවන්ගේ කාර්යභාරය හඳුනා දැක්වීම. |
| | - ව්‍යාපාරයක සාර්ථකත්වය සඳහා උපකාරක සේවා කළමනාකරණය කිරීමේ වැදගත්කම පැහැදිලි කිරීම. |

**(a)**

(1) තැන්පතු ලෙස අතිරික්ත මුදල් බාර ගැනීම.

(2) ව්‍යාපාරවලට මුදල් ණයට දීම

(3) චෙක්පතක් ගනුදෙනු සඳහා බලය පැවරීම.

(4) ඉල්ලා සිටිවිට අයිරා පහසුකම් සැලසීම.

(5) විදේශ මුදල් හුවමාරු කිරීම

(6) මුදල් ප්‍රේෂණ පහසුකම් සැපයීම.

(7) උපදේශනය

(8) මැදිහත් වීම තුළින් ජාත්‍යන්තර ව්‍යාපාර පහසුකම් සැලසිම.

**(ඕනෑම කරුණු 04 කට ලකුණු 02)**

**(b)**

(1) කාසි සහ නෝට්ටු නිකුත් කිරීම.

(2) සියලුම බැංකුවල බැංකුකරු ලෙස ක්‍රියා කිරීම.

(3) මූල්‍ය ප්‍රතිපත්ති පිහිටුවීම.

(4) රජයේ බැංකුකරු ලෙස ක්‍රියා කිරීම

(5) විනිමය අනුපාතික පාලනය කිරීම.

(6) ආර්ථික පර්යේෂණ සිදුකිරීම.

**(ඕනෑම කරුණු 03 කට ලකුණු 03)**

**(c)**

(1) **ණය පත්**

වාණිජ බැංකුවකින් හෝ බලය ලත් ආයතනයකින් දරන්නාට බලයලත් වෙළඳුනන්ගෙන් නියම කොට ඇති වටිනාකමක් දක්වන භාණ්ඩ හෝ සේවා ලබා ගැනිම සඳහා නිකුත්කරනු ලබන ණය පතකි. ණය සීමාවක් එහි නියම කර ඇති අතර ගණුදෙනුකරුට භාණ්ඩ හෝ සේවා එම සීමාව දක්වා ලබාගත හැකිය.

(2) **හරපත්**

ගිණුම්හිමියෙකුට මුදල් ආපසු ගැනීමට මෙන්ම භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීමට ඉටුකරවා ගැනීමට මෙම පත්‍රිකා භාවිතකළ හැකිය. මේවා වාණිජ බැංකුවලින් නිකුත්කරනු ලැබේ.

(3) **සමාර්ට් කාඩ්පත්**

මෙය සංකලිත විද්‍යුත් පත්‍රිකාවකි. නියමකළ මූල්‍ය වටිනාකමක් සහිත පතුරක් කාඩ්පතේ ගිල්වා ඇත. මෙය යොදා ගෙන ගණුදෙනුවක් නියමකළ පසු ගණුදෙනුවේ වටිනාකම කාඩ්පතින් හර වී ශේෂය අඩු වේ.

(4) **බිට් කොයින්**

ගණුදෙනු පුරුක් ජාලයකින් සමීක්ෂණය කර බ්ලොක් චේන් නමින් හැඳින්වෙන මහජන බෙදාහැරීම් ලෙජරයක සටහන් වේ. මැදිහත්වන්නෙකු නොමැතිව පරිශීලකට කෙලින්ම ගණුදෙනු කළ හැකිය.

**(ඕනෑම මුදල් වර්ග 03 කට ලකුණු 05)**

**(මුළු ලකුණු 10)**

05 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු

| |
|---|
| **ඒකක 3 - ව්‍යාපාරයක උපකාරක සේවා**<br>ඉගෙනුම් ප්‍රතිඵල - ව්‍යාපාරයක සාර්ථකත්වයට උපකාරක සේවා කළමනාකරණයෙහි වැදගත්කම පැහැදිලි කිරීම.<br>- උපකාරක සේවාවන්ගේ ලක්‍ෂණ පැහැදිලි කිරීම. |

**(a)**

**(1) සුරක්ෂිතභාවය හා ආරක්‍ෂාව සැලසීම:**

රක්‍ෂණය මූල්‍ය ආධාර සලස්වා ව්‍යාපාර සහ මනුෂ්‍ය ජීවිතයේ අවිනිශ්චිතතාවයන් අඩු කරයි. එය නිශ්චිත සිදුවීමකට එරෙහි සුරක්ෂිතතාවය සහ ආරක්ෂාව සලස්වයි. හැමවිටම හදිසි අලාභයක් පිළබඳ බියක් දැනේ. රක්‍ෂණය ඕනෑම හදිසි අලාභයකට එරෙහිව ආවරණය සලසයි.

**(2) රක්‍ෂණය සමඟ ව්‍යාපාරයේ කාර්යක්‍ෂමතාවය වැඩිවෙයි:**

ව්‍යාපාර හිමියෙකු අලාභ පිළිබඳ කරච්චලයෙන් නිදහස් වූ විට ඔහු සත්‍ය වශයෙන් ව්‍යාපාරය කෙරෙහි ඔහුගේ කාලය මිඩංගු කරනු ඇත. කරදරවලින් නිදහස් නම් හිමිකරුට ලාභය උපරිමකරණය සඳහා වඩා හොඳින් වැඩ කළ හැකිය. අභාවයේදී, දේපළ හානි වීමකදී, විනාශවීමේදී හෝ අතුරුදන්වීමේදී රක්ෂණ ඔප්පුවලින්, යම්කිසි ප්‍රමාණයක් ගෙවනු ලැබීම ව්‍යාපාරිකයන්ට සහතික වේ. අලාභයේ අවිනිශ්චිතතාවය ව්‍යාපාරිකයෙකුගේ හිතට අහිතකර අන්දමින් බලපානු ලැබේ.රක්ෂණය එම අවිනිශ්චිතතාව ඉවත් කර මහන්සිවී වැඩ කිරීමට ව්‍යාපාරිකයන් පොළඹවයි.

**(3) අවදානම් බෙදා හැරීම:**

අවදානම රක්‍ෂණයකරනු ලබන්නගෙන් රක්‍ෂණය කරන්නා වෙත බෙදා හැරීමට රක්‍ෂණයෙන් පහසුකම් සැලසේ. රක්‍ෂණයේ මූලික මූලධර්ම වන්නේ අවදානම මිනිසුන් විශාල ගණනක් අතර බෙදා දීමයි. පාඩුවක් ඇතිවන විට රක්‍ෂණය කරන්නාගේ අරමුදල් වලින් එයට වන්දි සැපයේ.

**(4) ණය පහසුකම් ඉහළයාම:**

රක්‍ෂණ ඔප්පුව ඇපයක් ලෙස තබා සමාගමට ණය ලබාගත හැකිය. ඔවුන්ගේ අභාවයේදී ආපසු ගෙවීම් නිශ්චිත බැවින් රක්ෂිත පුද්ගලයන්ට වැඩියෙන් ණය ලබාගත හැකිය. එසේ රක්‍ෂණ ඔප්පුව ඇපයට තබා ලබාගත හැකි ණය පොළියද සමග රක්‍ෂණ ඔප්පුවේ මූල්‍ය වටිනාකම නොඉක්මවිය යුතුය. මරණය සිදුවුවහොත් පොළීය සමඟ ණය පියවීම සඳහා මෙම වටිනාකම යොදාගත හැකිය. ණයට ගත් තැනැත්තා පොළිය ආපසු ගෙවීමට අකමැතිනම් ණයට දුන් තැනැත්තාට රක්‍ෂණ ඔප්පුව පවරා දී ණය මුදල හා ඒ මත පොළිය ගෙවිය හැකිය.

**(5) ව්‍යාපාරවල අඛණ්ඩබව:**

ඕනෑම ව්‍යාපාරයක,විශේෂයෙන් හවුල් ව්‍යාපාරයක ඕනෑම හවුල්කරුගේ මරණය හේතුවෙන් ව්‍යාපාරය නතර කළ යුතුය. කෙසේ වෙතත් ජීවත්ව සිටින හවුල් කරුවන්ට ව්‍යාපාරය නැවත ආරම්භ කළ හැකිය. අවස්ථා දෙකේදීම අභාවප්‍රාප්ත හවුල්කරුගේ පාර්ශ්වය සහ ව්‍යාපාරය ආර්ථික වශයෙන් පීඩාවට පත්වේ. එහිදී රක්ෂණ ඔප්පු ප්‍රමාණවත් අරමුදල් සපයනු ලැබේ. එක් එක් හවුල්කරුවා ව්‍යාපාරයේ ඔහුගේ ඇල්මැති ප්‍රමාණයට රක්ෂණය කරනු ලැබ ඇති අතර,අභාවප්‍රාප්තවූ හවුල්කරුවන්ගෙන් යැපෙන්නන්ට ඔහුට හිමි කොටස් ලැබෙනු ඇත. දේපළ රක්ෂණය යටතේ ව්‍යාපාරයක් දේපළ ආපදා වලට එරෙහිව රක්ෂණය කල හැකිය.

**(6) සේවකයන්ගේ සුභසාධනය:**

සේවකයන්ගේ සුභසාධනය සේව්‍යයාගේ වගකීමය. එමනිසා අකල් මරණය,ආබාධිතාව සහ ජීවිතයේ පශ්චාත් යාමය සඳහා ප්‍රතිපාදන සැලසීම ගැන සේවකයා වෙනුවෙන් සේව්‍යයා වගබලා ගත යුතුය. ජීවිත රක්ෂණය,හදිසි අනතුරුසහ ආබාධිත ප්‍රතිලාභ සහ විශ්‍රාම මගින් මෙම අවශ්‍යතා ලෙහෙසියෙන් සපුරා ගත හැකි අතර සමහර රක්ෂණ මගින් සාමාන්‍යයෙන් මේවා සලසා දිය හැකිය. සමූහ රක්ෂණ සඳහා වාරික සාමාන්‍යයෙන් සේව්‍යයා විසින් ගෙවනු ලැබේ. මෙම සැලැස්ම සේවා යොජකයන්ට තම වගකීම් ඉටු කිරීමෙහි ලා තිබෙන ලාබදායකම ක්‍රමයයි. ඉහත සඳහන් ප්‍රතිලාභ සහතික කරනු ලැබූ කල්හි සේවකයන් ඔවුන්ගේ උපරිම ධාරිතා බලය යොදවා තමන්ට පැවරෙන කාර්යන් සම්පූර්ණ කිරීමට කැපවනු ඇත.

**(ඕනෑම කරුණු 04 කට ලකුණු 06)**

**(b)**

(1) ජීවිත රක්ෂණය

(2) ගිනි රක්ෂණය

(3) මුහුදු රක්ෂණය

(4) මෝටර් වාහන රක්ෂණය

(5) මාර්ගැති මුදල් රක්ෂණය **(ඕනෑම ගිවිසුම් 04කට ලකුණු 02)**

**(c)**

(1) රක්ෂණ හිමිකම

(2) උපරිම විශ්වාසය

(3) හානි පූර්ණය

(4) ආදේශනය

(5) දායකය

(6) ආසන්න හේතුව

**(ඕනෑම මූලධර්ම 04 කට ලකුණු 02)**

**(මුළු ලකුණු 10)**

**අනිවාර්ය ප්‍රශ්නයකි.**

**C කොටස**

**(මුළු ලකුණු 20)**

---

**ඒකක 1 - ව්‍යාපාරයක සංකල්ප හා විවිධ සංවිධාන වර්ග**

**ඒකක 2 - ව්‍යාපාරික පරිසරය සහ ව්‍යාපාර සංවිධාන කෙරෙහි එහි බලපෑම**

**ඒකක 6 - ආර්ථිකයේ කශේරුව ලෙස කුඩා සහ මධ්‍යපරිමාණ ව්‍යවසායන්**

**ඒකක 7 - ව්‍යවසායකත්වයේ දායකත්වය**

ඉගෙනුම් ප්‍රතිඵල - විවිධ වර්ගයේ සංවිධාන තක්සේරු කිරීම.

- ව්‍යාපාරික පරිසරය සහ සංවිධානය කෙරෙහි එහි බලපෑම විශ්ලේෂණය කිරීම
- ආර්ථිකයක කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන්ගේ වැදගත්කම තක්සේරු කිරීම.
- සංවර්ධනයට ව්‍යවසායකත්වයේ වැදගත්කම පැහැදිලි කිරීම.

**(a)**

**වාසි**

(1) පිහිටුවීමෙහි පහසුවීම.

(2) ඔබටම වැඩකර ගත හැකිවීම.

(3) බදු සම්බන්ධ වාසි.

(4) පුද්ගලිකත්වය ආරක්ෂා වීම.

**(එකකට ලකුණු 1 බැගින් ලකුණු 02)**

**අවාසි**

(1) අසීමිත වගකීම.

(2) පුද්ගලික වත්කම් අවදානමට ලක්වීම.

(3) ව්‍යාපාරයෙන් යැපීමට සිදුවීම.

(4) සීමිත ප්‍රාග්ධනයන් තිබීම.

**(එකකට ලකුණු 1 බැගින් ලකුණු 02)**

**(b) ශක්තීන්** - ජ්ජ්ටී ත්‍යාග ලාභියෙකු වීම

- ජ්ජ්ටී සුදුසුකම සහ උපාධියක් තිබීම **(ලකුණු 1½)**

**දුර්වලතා** - ප්‍රාග්ධනයේ අඩුවීම

- ව්‍යාපාරය කේවලස්වාමී ව්‍යාපාරයක් වීම **(ලකුණු 1½)**

**අවස්ථාවන්** - වැඩසටහන් පිළිබඳ දෙමව්පියන් අතර දැනුවත්භාවය වැඩි වීම.

- හොඳම "කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයා" සම්මානය ඔහුට ප්‍රධානය කරනු ලැබීම. **(ලකුණු 1½)**

**තර්ජන** - වැඩිවන තරගකාරීත්වය

- කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාර අංශ මුහුණ පාන අභියෝග **(ලකුණු 1½)**

**(c)**

(1) ප්‍රධාන වාණිජ බැංකුවලින් ණය ලබාදීමට ඇති නොකැමැත්ත.

(2) තාක්ෂණික කුසලතා නොමැති කම.

(3) නිමැවුම්වල ගුණත්වය පවත්වාගෙනයාම.

(4) යටිතලපහසුකම් අඩුවීම.

(5) මහාපරිමාණ ව්‍යාපාරවලින් එල්ලවන තරගකාරීත්වය

(6) ව්‍යාපාරික නීතිරීති සම්බන්ධ ගැටළු. **(ඕනෑම ගැටළු 4 කට ලකුණු 04)**

**(d)**

(1) අවදානම් ගන්නා අය

(2) නවෝත්පාදකයන්

(3) ස්වයංඅභිප්‍රේරකයන්

(4) අනාගත නැඹුරුවක් ඇතිවුවත්

(5) වෙළඳපලෙහි අවස්ථා /හිඩැස් ඉවෙන් හෝ දැනගැනීමට හැකිවීම.

(6) නම්‍යතාවය

(7) සර්ව ශුභවාදීවීම **(ඕනෑම ලක්ෂණ 4 කට ලකුණු 02)**

**(e)**

(1) ප්‍රාදේශීය සංවර්ධනය සමව තබා ගැනීම.

(2) සමාජ සංවර්ධනයට සහයෝගය දීම.

(3) රැකියා නිර්මාණය

(4) භාවිතනොකරන සම්පත් උපයෝජනය

(5) නව තාක්ෂණය හඳුන්වා දීම.

(6) ජීවන තත්වය වැඩිදියුණු කිරීම

(7) දළ දේශීය නිශ්පාදනය හා ඒක පුද්ගල ආදායම වැඩිකිරීම.

**(ඕනෑම කරුණු 4 කට ලකුණු 04)**

**(මුළු ලකුණු 20)**